# කිඳුරු කුමාරයා සහ කුමරිය



සහේලි පෙරේරා

# කිඳුරු කුමාරයා සහ කුමරිය


**සහේලි පෙරේරා**

කතෘ


**කතෘගේ වෙනත් කෘති**

**කපටි නරියා**

**මහාමායා බාලිකා විද්‍යාලය**

**4 ශ්‍රේණිය E**

**2026/05/10**


**ISBN 978-624-211-141-4**

පිදුම

මගේ ආදරණීය

අප්පච්චීට....



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10


# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව

ඉස්සර කාලේ මුහුදේ රජතුමෙක් හිටියා. එයාගේ නම සාර්.එයා හරිම දක්ෂයි.නිර්හීතයි. එයාගේ බිරිඳ ලීසා රැජිණිය.එයාලගේ දූ කුමරිය මීණා කුමාරිකාව.



බොහෝ කාලයක් අසනීපෙන් සිටි රැජිණිය දවසක් හදිසියේම මිය ගියා. දූ කුමාරිකාව මේ නිසා ගොඩාක් දුක් වුණා. එයා වෙනදා වගේ මාළිගාවෙන් එළියට ගියෙත් නැහැ.කෑම කෑවෙත් නැහැ.



දවසක් රජතුමා මේ ගැන ගොඩක් කල්පනා කළා. එයා හිතුවා “මගේ දුව ඉන්නේ දුකෙන්, මම මේකට මොනවා හරි කරන්න ඕන” කියලා. රජතුමාට හොඳ අදහසක් ආවා.එයා කුමාරියට කුමාරයෙක් විවාහ කරලාදුන්නා.කුමාරයාගේ නම කැබිනෝජන්.එයාලා මුහුදේ වෙනම මාළිගාවක් හදාගෙනන එහි ජීවත් වුණා. ඊට පස්සේ මුහුදු රාජධානියායේ රජකම භාර ගත්තා.මාළිගාවේ රජ පවුලේ අයගේ පිළිමත් හැදුවා.



මෙයාලා මේ විදිහට රජ කරන අතරේ දවසක් රජතුමාගේ හමුදාවේ නායකයා බොහොම කලබලයෙන් දුවගෙන ආවා.එයා කිව්වා " දේවයන් වහන්ස, අපේ රාජධානියට බලවත් සතුරු ප්‍රහාරයක් එල්ල වෙනවා"කියලා. මෙය ඇසූ රජතුමාත් බොහොම කලබලයට පත් වුණා. "අපි දැන්ම ඒ පැත්තට පිටත් වෙමු" රජතුමා කිව්වා. මීරා කුමරියට

මාළිගාවටම වෙලා ආරක්ෂිතව ඉන්න කියලා රජතුමා සේනාව එක්ක සතුරු ප්‍රහාරය දෙසට පිටත්ව ගියා.

මාළිගාවේ සියලුම දෙනා බොහොම බියට පත් වෙලා.රාජධානියම අනතුරට පත් වෙලා කියලා එයාලට තේරුණා.

රජතුමා සෙබලුන් එක්ක සටන් කරා.එහෙම සටන් කරද්දි සතුරාගෙන් ආපු ඊ පහරක් රජතුමාගේ ඇඟට වැදුණා. පහරේ වේදනාවට රජතුමා කෑ ගැසුවා. ඒ දුටු සෙබලුත් කෑ ගැසූවා. මේ ශබ්දය ඇහිලා බියට පත් වුණ රැජිණත් මාළිගාවේ ඉදලා දුවගෙන ආවා.

හැමොම සටන් කරන අතර තවත් කාන්තාවක් එතනට ආවා. එයාගේ නම මරී. මරී කියන්නේ නපුරු මායාකාරියක්. එයා කැබිනෝජන් රජතුමාගේ පරණ සතුරෙක්.රජතුමාට එල්ල වුණ ඊ පහර නිසා එතුමා සිහිසුන් වුණා.



ඉතිං මායාකාරියට පුළුවන් වුණා මුහුදු රාජධානිය යටත් කරගන්න. එයා මාළිඟාවට ගිහින් ඔටුන්න පැහැර ගත්තා.එයා රජතුමාගේ සහ රැජීණගේ පිළිම කඩා දැමුවා. රජ මාළිගාවේ තිබු  දේවල් විනාශ කළා.ඊට පස්සේ මායාකාරියගේ පිළිම නෙලන්න කියලා සේවකයන්ට අණ කළා.

ඒ විතරක් නෙවෙයි සිහි නැතිව සිටි රජතුමාව මායාකාරිගේ මායා බලයෙන් ගසක් බවට පත් කළා. එයා මීරා රැජිනව හංසයෙක් බවට පත් කළා.රජ මාළිගාවේ හමුදාව ගස් බවට පත් කළා.සේවකයෝ රාජලියන් බවට පත් කළා.හංසයෙක් කරපු රැජිණ මනුස්සයෙක් වුනේ හොදින් හඳ පායන දවසට විතරයි.



මීරා රැජින හොදටම දුක් වුණා. එයා හොඳටම ඇඩුවා.ඒත් මායාකාරිය මහ හයියෙන් හිනා වුණා.

එයා ඉතිරි වෙලා හිටපු සේවකයන්ගෙන් හොඳටම වැඩ ගත්තා.මිනිස්සු බොහොම දුකෙන් කාලය ගත කළා.

මායාකාරියට පුළුවන් වුණා මාළිගාවට ගිහින් රජ කරන්න. එයා රජතුමාගෙත් රැජිණගෙත් පිළිම සහ පින්තූර කඩා විනාශ කළා. ඊට පස්සේ මායාකාරියගේ පිළිම නෙළන්න සේවකයන්ට අණ කළා.

මෙහෙම ටික දවසක් ගතවෙලා ගියා. එක දවසක් රාජධාණියට හොඳින් හඳ පෑවුවා. ඒ වෙලාවේ හංසයෙක් වෙලා හිටිය රැජිණ මනුස්සයෙක් වුණා. පිළිමයක් වෙලා හිටිය රජතුමාත් මනුස්සයෙක් බවට පත් වුණා. ඒ එක්කම රජතුමාගේ මහා මායා බලයත් ඔහුට ආපසු ලැබුණා.


දෙන්නම රජ මාළිගාව ඇතුළටම ගියා. මායාකාරියට කතා කරලා මෙහෙම කිවුවා ," මේ දැන්ම මගේ රාජධානියෙන් පිටව යන්න, නැත්නම් මම ඔයාව විනාශ කරනවා"

මායාකාරිය හයියෙන් හිනා වුණා. එයා දැනන් හිටියේ නැහැ රජතුමාට දැන් මායා බලය තියනවා

කියලා."මම යන්නේ නැහැ පුළුවන් දෙයක් කරන්න" මායාකාරිය කිවුවා.

රජතුමා එයාගෙ මායා බලයෙන් මායාකාරියව ඒ වෙලාවේම අලු කරලා දැම්මා.ඒ එක්කම මාළිඟාව තිබුණ තත්වයටම හැරුණා.

ඊට පස්සේ මුළු රාජධානියේ අයම සතුටින් ජීවත් වුණා.





# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අත්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දූරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලූ ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-141-4